මව් බිමේ හෝ වේවා වෙනයම් රටක සිටින අප සැමගේ පොදු සාර්ධර්මයක් බවට පත්ව ඇත්තේ පවුල් සංස්ථාව රැකගැනීමයි. විවාහ වී දරුවන් ලද දා පටන්ම අඹු සැමියන් වෙහෙසෙන්නේ සිය දරුවන්ගේ අනාගත අභිවෘද්ධිය සඳහා බොහෝ දෙනෙකු ඕස්ට්‍රේලියාව වැනි රටකට සංක්‍රමණය වන්නේද ඒ හේතුවෙන්මයි.

සංක්‍රමණය වූ දා පටන් එක එල්ලයේම දූ දරුවන්ගේ අධ්‍යාපනය හා කලාව, ක්‍රීඩාව අද විෂය බාහිර ක්‍රියාකාරකම් සමගින් දෙමාපියන් ගත කරන යුගය නිමා වන්නේ ඔවුන් තෘතියික අධ්‍යාපනයට යොමු වීමෙන් හෝ රැකියාවන්වලට යොමුවීමෙන් පසුවයි. ඉතින්බිතිව දෙමාපියන්ට ඇතිවන්නේ කාල රික්තයකි. මේ රික්තතය පියවීමට ඔවුන් තෝරා ගන්නා එක ක්‍රමවේදයක් වන්නේ ඔවුන් කුඩා කල ඇළුම් කල සමත්කම් පෑ දෑවලට නැවත සමීප වීමයි. කෙසේ වුවද ඒවාට තරුණ දූ පුතුන් එක්වීම නම් සුලබ දසුනක් නොවේ. එහෙත් එවන් විරල එකතුවක කල එළිදැක්වීමක් ඔක්තොම්බර් 25 දා සවස සයයි නිහට හැජඩන් හක්ති ''රිවර්ගම

පවුලේ ගීතමය ප්‍රයත්නයක් "යෞවනයේ බැඳි"

පලෝමිං සෙන්ටර්''ශාලාවේදී පැවැත්වීමට කටයුතු සංවිධානය වෙයි.

කාලයක පටන් මෙල්බන් වේදිකාවේ ගී ගයමින් හා වයමින් රසිකයන් පිනවූ ලූකන් හා කුමුදුනී ප්‍රනාන්දු යුවල එළි දක්වන '' යෞවනයේ බැඳි'' සංගත තැටියයි. ඔවුන්ගේ ගී ගයමින් මගේ අනු එලය වන්නේ ඉංග්‍රීසි බසින් ගීයක් ගයමින් ඔවුන්ගේ දියණියෝ තිදෙනා වන සච්ත්‍රා, හසිනි, සහ මළිෂා ද ඊට දායක

සිසිර දිසානායක

වන්නෝය. කුමුදුනී අප අතරින් වියෝ වූ ප්‍රවීන සංගීතවේදී මර්වින් පෙරේරා ශිල්පියාණන්ගේ නැගණියකි. ''යෞවනයේ බැඳි'' සංගත කැටිය පිළිබඳවත්, එළිදැක්වීමේ ප්‍රසංගයත් පිළිබඳවත් සාකච්ඡා කිරීමට අප හා එත් වූයේ ලූෂන් ප්‍රනාන්දු ගිතවතායි.

''ඇත්තටම අපිට මුල ඉඳලම සංගීතයේ වටපිටාව තිබුණා. මමත් මර්වින් පෙරේරා සංගීතවේදියාගෙන් සංගීතය ඉගෙනගත්ත කෙනෙක්. මම ඉගෙන ගත්ත ගිටාර් වාදනයයි. ඊට පස්සෙ පල්ලියේ සංගීත කටයුතුවලට සහභාගී වුණා. ඒ වැඩඩවලදී තමයි මර්වින් පෙරේරා මහත්තයාගෙ නැගණිය එක්ක ගිතවත්කමක් ඇති වුණේ. ඒ ගිතවත්තම ඉතිං විවාහයකින් තමයි කෙළවර වුණේ.'' ලූෂන් බිම බලාගෙන අතිංසක ලෙස සිනාසෙයි.

''මගේ බිරිඳට හොඳට කී බෝඩ් වාදනය කරන්න පුළුවන්. ඇයගෙන් එදා ඉඳන් ලැබුණු සහයෝගයෙන් තමයි මට මේ තරම් දුර එන්න පුලුවන් වුණේ. ඇය මාව හිවැරදි කළා. ඉතිං මේ සංගත තැටියට එකතු වුණ නිර්මාණ වුණත් ඒ කාලෙ ඉඳන් වරින් වර අපි කරපු දේවල් . ඒ නිසා ඒවායේ තියෙන්නෙ අපේම අත්දැකීම්. ලංකාවෙදි වගේම අපි මෙතෙක් පල්ලියෙ සංගීත වැඩකටයුතු වලට දායක වුණා. නර්වේරන්වල අවර් ලේඩි ක්‍රිස්තියන් පල්ලිය, හැම්ඩන් පාස්වල සෙන්ට් තෙවින්ස් පල්ලිය ඒ අතර මුලටම තියෙනවා. සමෝහන් ජාතික යුවලත් එක්ක එකතු වෙලයි දැනට මේ ගීතිකා කණ්ඩායම කරගන යන්නේ. මේ දේවල්වලිනුත් අපිට ලැබෙන්නෙ ලොකු හයියක්.''

''සච්ත්‍රා, අපේ ලොකු දුව විවාහ වෙලා දැනට සිඩ්නි නුවරයි පදිංචිය. ඇය වෛද්‍යවරියක් විදියට සේවය කළත් කී බෝඩ් එක පියානෝ එක වාදනය හොඳින්ම ඉගෙන ගත්තා. තුන් වෙනි දුව මළිෂා වයලිනය ඉගෙන ගත්තා. දෙවෙනි දුව තමයි හසිනි. මේ තුන්දෙනාම රංගන - උදුම්බරා නැටුම් ගුරුවැන්ගෙන් නැටුම් ඉගෙන ගත්තා. ඒ නිසා නුග දෙනෙක් එයාලව දන්නවා. හසිනියි, මළිෂායි රසිකා කුලසිංහ නැටුම් ගුරුවරියගෙනුත් නැටුම් ඉගෙන ගත්ත. දැන් යාළුවොත් එක්ක එකතුවෙලා එයාලම නිර්මාණය කරගන්න නැටුම් එහෙමත් ඉදිරිපත් කරනවා. මේ කලාත්මක දේවල් ඇත්තටම එයාලගෙ අධ්‍යාපනයට උදව්වක් වුණ බව විශේෂයෙන්ම කියන්න ඕන.''

මෙවන් පසුබිමකින් බිහිවන නිර්මාණ එකතුවක් වන ''යෞවනයේ බැඳි'' ගී එකතුව පිළිබඳවයි අප අනතුරුව විමසිලිමත් වූයේ.

පූජ්‍ය ගරු රඹුක්කන සිද්ධාර්ථ ස්වාමීන්වහන්සේ අපට ගීත දෙකක්ම ලියලා දුන්නා. ඒ වගේම ගරු ආචාර්ය කැමිලස් නිහාල් ප්‍රනාන්දු පියතුමා ලියපු ගීයතුත් එකතු වුණා. කුමුදුනී ගීත තුනක් ලියලා තියෙනවා. මගේ ගී පද රචනාත් දෙකක් තියෙනවා. ගරු රඹුක්කන සිද්ධාර්ථ ස්වාමීන් වහන්සේ හැරෙන්න ඔය කියපු ඉතුරු පිරිස් අපේ පවුලට සම්බන්ධ අය. ඒ ඇරෙන්න ලංකාවේ ඉන්න රවි සිරිවර්ධනගේ ගීයකුත් මෙහේ අපි අතරෙ ඉන්න වරුණ සාවින්දගේ ගී දෙකකුත්, පද්මසිරි හේරත්ගේ ගීයකුත්, මහින්ද දිසානායක දිවුල්ගනේගේ ගීයකුත් , සිසිර දිසානායකගේ ගීත තුනකුත් සංගත තැටියට ඇතුලත්. සිසිර දිසානායක ඉංග්‍රීසි බසින් ගීතයක් ලියා දීම විශේෂයක්. ඒ ගීය ගැයුවේ මගේ දියණියන් තිදෙනායි. සංගීතය තිසර බණ්ඩාරගෙන්. ඊට අමතරව මර්වින් පෙරේරාගේ එක ගී තනුවකුත්, මහින්ද බණ්ඩාරගේ ගී තනු පහකුත්, එච්. එම් ජයවර්ධනගේ ගී තනු තුනකුත්, ලූෂන් පෙරේරාගේ ගී තනුවකුත් ඇතුලත් වෙනවා. මේ ගී පද රචකයින්ටත් තනු නිර්මාණය කරපු ශිල්පීන්ටත් අපි ස්තූතිවන්ත වෙනවා. මගේ බිරිඳ කුමුදුනී නිර්මාණය කරපු ගීතනු පහක්ම මේ අතරට එකතු වෙලා තියෙන එක තවත් විශේෂයක්.

''අපි එදා ඉඳන් ඉන්න ගමන් ගීත ලියාගෙන තනු නිර්මාණය කරගෙන ගැයූ ගීත අතරට අතික් රචකයින්ගේ, සංගීත ශිල්පීන්ගේ නිර්මාණත් එකතු කරගන්න ගිනුවේ ඒ අයගේ දක්ෂකම් මේ දේවල්වලට එකතුකර ගන්න. සමස්තයක් විදිහට මේ අපේ පවුළේම උදව්ව එළිදක්වන ගීත එකතුවක්'' ලූෂන් නැවතත් උපස් යුවල අතරින් ඉවත බලාගන සිනාසෙයි.

ලූෂන්, කුමුදුනී යුවල මේ පවුලේ නිර්මාණ එකතුව එළිදක්වන්නේ කෙළසින්ද?

''මුලින්ම අජ්‍ිහිතුවෙ සුළුවට නොමිලයේම එළිදැක්මක් සංවිධානය කරන්න. ඒත් අපිට වෙන්කරගන්න ඉඩක් ලැබුණෙ හැම්ඩන් පාක් වල ''රිවර්ගම් ප්‍රර්ගෝමිං සෙන්ටර්''ශාලාවයි. ඉතිං අපි හිතුවා මේක ප්‍රසංගයක් විදිහටම ඉදිරිපත් කරන්න. ප්‍රසංගය තියෙන්නෙ ඔක්තොම්බර් 25 වෙනි සෙනසුරාදා හවස හයටයි. දන්න හඳුනන හැමෝගෙන්ම අපි ඉල්ලන්නේ එදාට හැම්ඩන් පාක්වල ''රිවර්ගම් ප්‍රර්ගෝමිං සෙන්ටර්'' ශාලාවට එක් රැස්වෙලා අපට එකතු වෙන්න කියලයි.''

ශ්‍රී ලංකා ප්‍රර්මානු කාර්මික අභ්‍යාස ආයතනයේ ආදි ශිෂ්‍ය සංගමය එදා ඉඳලම මට සහයෝගය දෙනවා. ඒ වගේම තවත් බොහෝ දෙනෙක් මට උපකාර කරනවා. ඉතිං ඒ අයවත් බොහොම ආදරයෙන් සිහිපත් කරනවා. ලූෂන් නැවතත් සිනාසෙමින් අපි වෙත බැලුවේ ඔය ඇතැයි ඉඟි කරමිනි. ඉතා කෙටියෙන් පිළිතුරු දෙමින් සරලව කතා කරනා ලූෂන් ප්‍රනාන්දු හිතවතාව තවදුරටත් වෙහෙස කරවීමට අපි උත්සාහ නොකළෙමු.

ශ්‍රී ලංකාවෙන් පිට, ශ්‍රී ලාංකික නිර්මාණ බිහිවීම අතින්, ඕස්ට්‍රේලියාවේ මෙල්බර්න් පුර-වරයට ලැබෙන්නේ වෙනත් කිසිම රටකට නො-දෙවෙනි ස්ථානයක්. ඕනෑම කලා ක්ෂේත්‍රයක, ගීත, ලේඛන, වෙලි නාට්‍ය, සිනමා, මේ සෑමම ක්ෂේත්‍රයකටම නිර්මාණ මෙල්බර්න් නුවරින් බිහිවීම අපට සුලභව දකින්න පුළුවන් දෙයක්.

මේ ක්ෂේත්‍ර අතර වේදිකා නාට්‍යයට හිමිවන්නේ විශේෂ ස්ථානයක්. 1960 දශකයේ සිට මේ තාක් කල් මෙරටට සංක්‍රමණය වූ ශ්‍රී ලාංකි කයන්ගේ නොමසුරු දායකත්වය, උද්‍යෝගිමත් බව නිසාම මෙසේ බිහිවන නිර්මාණ වල උසස් ප්‍රමිතියකුත් දක්නට ලැබෙනවා.

වේදිකා නාට්‍ය ප්‍රබල මාධ්‍යයක් ලෙස හා මුලින් සඳහන් කළා. වේදිකා නාට්‍ය, වෙලි නාට්‍ය හෝ සිනමා නිර්මාණ මෙන් සංස්කරණය වූ නිපැයුම් නොවේ. වේදිකා නාට්‍යයක් යනු පුහුණු වීම් අදියරේම සංස්කරණය කරගත් ශුද්ධ වූ සජීවී කලා නිර්මාණයක්.

''ස්වාමි පුරුෂයින්ට පාසලක්'' සිංහලට පරිවර්තනය කලේ අප අතරම වෙසෙන කලාවට ලැදියාවක් දක්වන සෑම් වීරරත්නයි. විදේශ භාෂාවකින් ලියැවුණු නාට්‍ය පිටපතක්

මෙය වේදිකාව මත පෙළහර පානා ශිල්පියා සහ ප්‍රේක්ෂකයා අතර ඝෘදු සම්බන්ධය ගොඩනගමින් කෙරෙන ව්‍යායාමයක් නිසා රංගන ශිල්පීන්ගේ විනය හා හික්මීම උසස් මට්ටමක පැවතිය යුතුය.

ඉහත සඳහන් දෑ වලින් පරිපූර්ණ උසස් නිර්මා-ණයක් දැකබලා ගැනීමේ අවස්ථාවක් මෙ'පුර කලා සහෘදයයකට ළඳා වුනා මීට සති කිහිපයකට ප්‍රථම. ඒ තමයි 17 වන සියවසේ ප්‍රංශයෙන් බිහිවූ ශ්‍රේෂ්ඨ රංගන වේදියෙක් හා නාට්‍ය රචකයෙක් වූ Jean – Baptiste Po-quelm Moliere ගේ වේදිකා ප්‍රහසනයක් වූ "School for Husband" නම් වූ නාට්‍යයේ සිංහල පරිවර්තනය ''ස්වාමිපුරුෂයන්ට පාසැලක්'' නමින් වේදිකා වේදිකා ගත වීම.

උසස් නාට්‍ය අධ්‍යක්ෂණයේ යෙදෙන පිරිස් වෙතින් එදකසැරද ගේ මෙම නාට්‍ය ගිලිගී යෑමට ඉඩක් නැත. ලෝකයේ දැනට බිහිවී ඇති ප්‍රහසන නාට්‍ය අතරේ ප්‍රබල ස්ථානයක් ගන්නා මෙම නාට්‍යයට පාදක වන්නේ සර්වකාලීන තේමාවක්.

ප්‍රහසනය යනු කුමක්ද?

ප්‍රහසනය යනු මිනිස් සංතානයේ උපදින, දුක, ශෝකය, භය, කරුණාව වැනි තවත් දෙයක්. යමක් දැකීමේන අප සිත් තුල ජනිතවන තවත් රසයක්. ප්‍රහසනයත් අන් රස සේම අප සිත් තුලින් මතුවන දෙයක් මිස බලෙන් පැටවිය හැකි දෙයක් නොවේ.

නාට්‍යයක රචනය තුලින් හා රංගන ශිල්පලීන් මෙන්ම හිශ්වල මෙවලම් හරහා ප්‍රේක්ෂකයාට විත්දනයක් විනෝදාස්වාදයක් ලබා දීම ලෙස, ප්‍රහසනය අර්ථ දැක්වීමේ වරදක් ඇතැයි මම නොසිතමි.

නාට්‍යයක් මගින් ප්‍රහසනය දැනවීමේදී බොහෝ ප්‍රවේසම් විය යුතුය. නාට්‍ය රචනයේදී දෙපිට කැපෙන වචන හෝ ජුගුප්සාජනක භාෂා කිසියම් ජවනිකාවකට හෝ දෙකකට යෙදීමෙන් නිර්මාණය හරහා යම් තරමක විනෝදයක් ලබා දිය හැකි වුනත් ඒ තුලින් සරල විත්දනයක් ලැබෙනවාට වඩා වැඩි දෙයක් අපේක්ෂා කල නොහැකිය.

ප්‍රහසනය මුළු නිෂ්පාදනය පුරාම ගැබ්විය යුතුය. පසුගිය කාලයේ ශ්‍රී ලංකාවේ බිහිවූ ප්‍රහසන ලෙස හැඳින්වූ සමහරක් නිර්මාණ වල තියම ප්‍රහසනය තිබේදැයි විමසීම වටී.

සිංහල නාට්‍ය පිටපතකට සකස් කිරීමේදී තිබිය යුතු ඉවසීමත්, සංයමයත් ඔහු තුල තිනු බව මෙම නාට්‍ය නැරඹූ ප්‍රේක්ෂකයන්ට හැඟී යන්නට ඇත. මේ නිසාම මෙම නාට්‍ය නැරඹූ ප්‍රේක්ෂකයන්ට තැනකට ගෙනා මුල්ම කාර්යය වන්නේ මේ පෙළේ නාට්‍ය පිටපත් රචනයයි.

ඊලඟට මා දකින්නේ ජය ශ්‍රී චන්ද්‍රපීත් නම් වූ අපේ ශ්‍රේෂ්ඨ රංගන ශිල්පියාගේ ප්‍රතිභාවයි. ලංකාවේ පුරෝගාමී නාට්‍යකරුවන්ගේ නිරන්තර ඇසුරින් ලැබූ ප්‍රවීණත්වය, මෙම නාට්‍යයේ අධ්‍යක්ෂණය තුල කැපී පෙනෙන දෙයක්. මා පුද්ගලිකව දැක තිබෙන දෙයක් තමයි. චරිතවලට ශිල්පීන් තෝරා ගැනීමේදී ඇති, එහෙත් කවදාකවත් නොපෙනුනු හැකියාවක් ඔහු හෝ ඇය තුලින් මතුකර ගැනීමේ විශේෂ දක්ෂතාවක් ඔහු සතුයි.

ජවනිකා අතර ඇති සම්බන්ධය අඛණ්ඩව පවත්වමින් ප්‍රේක්ෂකයන් අපේක්ෂා භංගත්වයට පත් නොවන ආකාරයට නාට්‍ය අවසානය දක්-වාම ගෙන යාම සංකීර්ණ කටයුත්තක්. ජය ශ්‍රී චන්ද්‍රපීත් තම ප්‍රවීනත්වය මැනවින් පෙන්වන නිර් මාණයක් ලෙස මෙම නාට්‍ය හැඳින්විය හැකිය.

මෙම නාට්‍යයේ රංගනයේ යෙදෙන, අෂාන් ඩයස්, සුලෝචනා විතානාරච්චි, මංජිත මාලුජිත්, ජගත් මුනසිංහ, පවන්ති නා-නායක්කාර, රයේශ් ගුණසේකර, ගයනි මීමනගේ, ප්‍රසන්න හේවගේ දොන් අමිල වන සුන්දර - මේ හැම කෙනෙකුගේම ප්‍රතිභාත්මක රංගනය නාට්‍යයේ සංයුතිය රැකගෙන ප්‍රේක්ෂක අවධානය නොබිඳව පවත්වාගෙන යාමට නොමඳ සහයක් ලබාදීම මෙම නාට්‍යයේ සාර්ථකත්වයට තවත් විශේෂ හේතුවක් වුනා.

සංගීතය, වේශ නිරූපණය, නාට්‍යට උචිත ඒ ඒ කාල වකවානුවලට ගැලපෙන ඇඳුම් නිර්මාණ,වේදිකා පසුතල නිර්මාණ, වේදිකා පරිපාලනය මෙන්ම ආලෝක කරණය තුළින්ද ඒ ඒ ශිල්පීන් දැක්වූයේ අගැයිය යුතු දක්ෂතා.

මේ හැම දේටම අමතරව, මා විශ්මිත කල අනෙක් දෙය වන්නේ අඛණ්ඩව සිදුවුනු දෙබස් ගනුදෙනුවයි. රංගන ශිල්පීන් සියළු දෙනාගෙන්ම බාධාවකින් පමාවකින් තොරව දෙබස් ගනුදෙනුව සිදුවූ අයුරු පුදුම සහගතයි.

සමස්තයක් ලෙස ගත්කල, නාට්‍යක තිබිය යුතු අංග සියල්ලෙන්ම පරිපූර්ණ නාට්‍ය නිර්මාණයක් ලෙස මෙම ''ස්වාමිපුරුෂයින්ට පාසැලක්'' නාට්‍ය අැගයීමට ලක්කිරීමට කැමතියි.